# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1780/05 — 2012 ඔක්තෝබර් මස 15 වැනි සඳුදා - 2012.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, නීතිඥ අතුල විජේසිංහ වන මාහට 1995/4 දරන වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 41 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ප්‍රඥප්තියේ 17(ඊ) වගන්තිය යටතේ පනවනු ලබන නියෝග මතු දැක්වෙන ආකාරයෙන් බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නීතිඥ අතුල විජේසිංහ,
ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය,
පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල, අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු, ඉඩම් ප්‍රවාහන, පරිසර, සංචාරක,
ආයෝජන සම්බන්ධීකරණ, සමුපකාර සංවර්ධන සහ ආහාර
සැපයුම් හා බෙදා හැරීම් පිළිබඳ පළාත් අමාත්‍ය,
වයඹ පළාත.

වයඹ පළතේ පළාත් සභාවේ 1995 අංක 04 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තියේ 17(ඊ) වගන්තිය යටතේ සාදා ප්‍රසිද්ධ කරනු ලැබේ.

01. මෙම නියෝග මගීන්ගේ ආරක්ෂාව සහ සැප පහසුව සහතික කිරීමේ නියෝග ලෙස හඳුන්වනු ලබන අතර එකී නියෝග 2012.09.01 වැනි දින සිට බලාත්මක වන්නේය.

1 වැනි කොටස

02. වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් නිකුත් කරන ලද මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක හෝ වෙනත් අධිකාරියක් යටතේ මගී ප්‍රවාහන සේවාවේ යෙදෙන සෑම බස්රථයකම සේවය කරනු ලබන සෑම රියැදුරෙකු සහ කොන්දොස්තරවරයෙකුම එකී බස්රථයේ සේවය කරනු ලබන සෑම අවස්ථාවකදීම අධිකාරිය විසින් නියම කරනු ලබන නිල ඇඳුමකින් සැරසී සේවයේ යෙදිය යුත්තේ ය.

03. රියැදුරන් සහ කොන්දොස්තරවරුන් විසින් පාවිච්චි කළ යුතු නිල ඇඳුම මෙහි පහත පළමු වන උප ලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිල ඇඳුම විය යුතු අතර එකී නිල ඇඳුමෙහි අධිකාරිය විසින් නියම කරනු ලබන නිල ලාංඡනය සෑම අවස්ථාවකම පැළඳිය යුතු වේ.

04. රියැදුරන් සහ කොන්දොස්තරවරුන් නිල ඇඳුමෙහි පැළඳිය යුතු ලාංඡනය මේ පහත 02 වැනි උපලේඛනයේ පරිදි සකසා තිබීම අනිවාර්ය වේ.

1A - PG 001404 — 430 (2012/10)

05. උඩුකයට නියම කර ඇති (කමිසය) මෙම නියෝගවල දැක්වෙන නිල ඇඳුම අඳින සෑම අවස්ථාවකම රියැදුරු සහ කොන්දොස්තරවරයා වළලුකර දක්වා වැසෙන කලිසමක් හෝ සරමක් ඇඳ සිටිය යුතු වන්නේය.

06. සේවයේ යෙදී සිටින කාලය, යන්න අදාල බස්රථයට අදාල දිනයේ මුදල් ගමන්වාරය හිමි වේලාවේ සිට ගමන්වාරය අවසන් වන වේලාව දක්වා සම්පූර්ණ කාලය ඇතුළත් වේ.

07. නිල ඇඳුම සහ නිල ලාංඡනය අධිකාරිය විසින් නියම කරනු ලබන ආකාරයට වෙනස්වන්නේ නම් හෝ පටහැනි වන්නේ නම් නිල ඇඳුම සහ නිල ලාංඡනය පැළඳ නොසිටීමක් ලෙස සැලකිය යුතු වේ.

08. අදාළ බස්රථයට ගමන් වාර ලබාගැනීමේ දී එම බස්රථයේ රියැදුරු සහ කොන්දොස්තරවරයා නියමිත නිල ඇඳුමෙන් සැරසී නිල ලාංඡනය පැළඳ නොසිටින්නේ නම් වේලා සටහන්කරු විසින් අදාළ බස්රථයට ගමන්වාර ලබා නොදිය යුතු අතර ඒ සම්බන්ධයෙන් අදාල ස්ථානභාර නිලධාරිවරයාට ද දන්වා සිටිය යුතු වන්නේ ය.

09. අධිකාරිය විසින් නියම කරනු ලබන නිල ඇඳුමින් සැරසී නිළ ලාංඡනය පැළඳ රියැදුරන් සහ කොන්දොස්තරවරුන් සේවයේ යෙදී සිටී ද යන්න විපරම් කිරීමේ වගකීමක් අදාල බස්රථයේ අවසර පත්‍රධාරියාට ද පැවරේ.

10. අධිකාරිය විසින් නියම කරනු ලබන නිල ඇඳුමකින් සැරසී නිළ ලාංඡනය පැළඳ නොසිටින රියැදුරන් සහ කොන්දොස්තරවරුන් සේවයේ යොදවන මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රධාරීන් මෙම නියෝග කඩකිරීමක් කරන බවට සැලකිය යුත්තේ ය.

11. රියැදුරන් සහ කොන්දොස්තරවරුන් නිල ඇඳුම පිරිසිදුව තබාගත යුතු අතර නිල ඇඳුම සහ නිල ලාංඡනය සම්බන්ධයෙන් අධිකාරිය විසින් කලින් කළ දෙනු ලබන උපදෙස් පිළිපැදිය යුතු වන්නේ ය.

12. 1. නිල ඇඳුම සහ නිල ලාංඡන සම්බන්ධයෙන් පනවා ඇත්තා වූ නියෝග කඩකරන රියැදුරන් සහ කොන්දොස්තරවරුන් වරදක් සිදු කරන අතර එසේ වරදක් සිදුකරන

(i) පළමු වතාවට රු. 250/ක ;

(ii) දෙවන වතාවට රු. 500/ක ;

(iii) තුන්වන වතාවට රු. 1000/ක ;

සේවා ගාස්තුවක් ගෙවීමට යටත් වන්නේ ය.

2. නිල ඇඳුම් සහ නිල ලාංඡන සම්බන්ධයෙන් තුන්වන වතාවෙන් පසු නියෝග කඩකරන රියැදුරන් සහ කොන්දොස්තරවරුන්ගේ රියැදුරු සහ කොන්දොස්තර ලියාපදිංචිය අවලංගු වන අතර එකී අවලංගුවීම අධිකාරිය විසින් අදාල රියැදුරාට සහ කොන්දොස්තරවරයාට දැනුම් දී දින 07ක් ඇතුලත අධිකාරිය විසින් නිකුත් කර ඇති ලියාපදිංචි රියැදුරු හැඳුනුම්පත හෝ කොන්දොස්තර බලපත්‍රය හෝ එම රියැදුරා විසින් හෝ කොන්දොස්තරවරයා විසින් හෝ අධිකාරිය වෙත ආපසු භාරදිය යුතු වේ.

13. (i) තුන්වන වතාවෙන් පසුව නිල ඇඳුම් සහ නිල ලාංඡන සම්බන්ධයෙන් නියෝග උල්ලංඝනය කරන රියැදුරන් හෝ කොන්දොස්තරවරුන් සේවය කරන බස්රථ අසාදු ලේඛනගත කරනු ලැබිය යුතු අතර වාර දෙකකට වඩා අසාදු ලේඛනගත වීම අදාල බස්රථයේ අවසරපත්‍රය අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට හේතු වේ.

(ii) අධිකාරියේ සභාපතිවරයාගෙන් උපදෙස් පැතීමකින් තොරව නිල ඇඳුම් සහ නිල ලාංඡන නියෝග කඩකිරීම සම්බන්ධයෙන් අසාදු ලේඛනගත කර ඇති කිසිදු බස්රථයක් සඳහා ගමන්වාර ලබාදීම හෝ මාසික ධාවන සටහන් පත් නිකුත් කිරීම අධිකාරියේ වෙනත් කිසිදු නිලධාරියකු විසින් නොකළ යුතු ය.

### ඉහත කී පළමුවන උපලේඛනය

***නිල ඇඳුම.*** - අත්කොට සාමාන්‍ය කමිසයකි. වම්පස උඩ සාක්කුවකි. පහත දෙපස සාක්කු දෙකකි. නිල ඇඳුම සම්පූර්ණයෙන්ම අහස් නිල් වර්ණයෙන් විය යුතු ය. කමිසයේ රෙදි වර්ගය කැස්පර් ලෙස තෝරාගෙන ඇත.

### රියැදුරු/කොන්දොස්තර මහතුන්ගේ නිල ඇඳුම



### ඉහත කී දෙවන උපලේඛනය

***නිල ලාංඡනය.*** - නිල ලාංඡනයේ දකුණු පස සේවක මහතාගේ මුලකුරු සමග නම, රියැදුරු ද කොන්දොස්තර ද යන වග දිග අඟල් 2 1/2 සහ පළල අඟල් 1 1/2 ප්‍රමාණයේ ප්ලාස්ටික් හතරැස් තහඩුවේ කහපාට පසුබිමේ නිල් වර්ණයෙන් එම්බෝස් ක්‍රමයට අකුරු මුද්‍රණය කළ යුතු ය.



II වැනි කොටස

1. වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් නිකුත් කරන ලද මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක හෝ වෙනත් අධිකාරයක් යටතේ මගී ප්‍රවාහන සේවාවේ යෙදෙන සෑම බස් රථයකම ගමන් ගන්නා සෑම මගියකුටම අධිකාරිය විසින් අනුමත කර සහතික කරන ලද්දා වූ ප්‍රවේශපත්‍ර නිකුත් කරන යන්ත්‍රයකින් නිකුත් කරන ප්‍රවේශ පත්‍රයක් නිකුත් කළ යුතු ය.

2. අදාල බස්රථයේ මගීන්ට ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සඳහා පාවිච්චි කරනු ලබන ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ යන්ත්‍රය සෑම මාස 06කට වරක්ම හෝ අධිකාරිය විසින් නියෝග කරනු ලබන ඕනෑම අවස්ථාවක අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. මගීන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම සඳහා පාවිච්චි කරනු ලබන ටිකට් යන්ත්‍රය ජංගම පරීක්ෂකවරුන් විසින් හෝ පරීක්ෂා කිරීම සඳහා අධිකාරියේ බලයලත් වෙනත් නිලධාරියකු ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක අදාල බස්රථයේ කොන්දොස්තරවරයා විසින් වහාම ඉදිරිපත් කළ යුතු ය.

4. මගී ප්‍රවේශපත්‍ර යන්ත්‍ර මගින් නිකුත් කරනු ලබන සෑම ප්‍රවේශපත්‍රයකම පහත විස්තර සියල්ලම අනුපිලිවෙලින් නිවැරදිව සහ පැහැදිලිව මුද්‍රණය වී තිබිය යුතු යඃ-

1. බස්රථයේ ලියාපදිංචි අංකය ඃ-
2. මගී අවසර පත්‍රයේ අංකය ඃ-
3. දිනය ඃ-
4. වේලාව ඃ-
5. ගමන ආරම්භය ඃ-
6. ගමනාන්තය ඃ-
7. ගාස්තුව ඃ-
8. කොන්දොස්තරගේ ලියාපදිංචි අංකය ඃ-
9. රියැදුරුගේ ලියාපදිංචි අංකය ඃ-
10. බස්රථය රක්ෂණය කර ඇති රක්ෂණ ආයතනය ඃ-

5. දෛනිකව නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර පිළිබඳ වාර්තා දින, මාස, වර්ෂ පිළිවෙලින් සකස්කර අධිකාරිය විසින් ඉල්ලා සිටින ලද ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කිරීම සඳහා අදාල බස්රථයේ අවසර පත්‍රධාරියා විසින් සුරක්ෂිතව තබා ගත යුතු වේ.

6. වෙනස්කරන ලද හෝ විකෘති කරන ලද හෝ අපැහැදිලි ලෙස මුද්‍රණය කරන ලද හෝ අධිකාරිය විසින් නියම කරන ලද විස්තර ඇතුළත් නොවන ප්‍රවේශපත්‍රයක් කිසිදු අවස්ථාවක කොන්දොස්තරවරයකු විසින් මගියකුට නිකුත් නොකල යුතු ය.

7. ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ දෝෂ හෝ මුද්‍රණ දෝෂ පවතින කිසිදු ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ යන්ත්‍රයක් කිසිදු කොන්දොස්තරවරයකු විසින් පාවිච්චි නොකල යුතු ය.

8. ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ යන්ත්‍රය හදිසි ආපදාවකට හෝ ක්‍රියා විරහිත වීමකට භාජනය වූ වහාම ඒ පිළිබඳව ආසන්නයේම පිහිටි බස් නැවතුම් පොළෙහි ස්ථාන භාර නිලධාරිවරයා වෙත ඒ බව දන්වා, දැන්වීම සම්බන්ධයෙන් එකී ස්ථාන භාර නිලධාරිවරයාගේ අත්සන සහිතව මාසික ධාවන පත්‍රයෙහි ඒ බව සටහන් කරවා ගත යුතු ය.

9. ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ යන්ත්‍රය වලක්වාගත නොහැකි හදිසි ආපදාවකට ලක් වූ අවස්ථාවක දී ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සඳහා අධිකාරිය විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර පොතක් බස්රථය තුළ තබාගත යුතු අතර එසේ නිකුත් කරනු ලබන ප්‍රවේශපත්‍ර මාර්ග ලේඛනයකට සම්බන්ධ කර නිකුත් කළ යුතු ය.

10. ප්‍රවේශපත්‍ර නිකුත් කරන යන්ත්‍රය අක්‍රීය වන ආකාරයට හෝ මුද්‍රණය කරනු ලබන ප්‍රවේශපත්‍ර දෝෂ සහගතව මුද්‍රණය වන පරිදි හෝ කිසිදු ආකාරයක වෙනසකට ලක්කිරීම නොකළ යුතු වන අතර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ යන්ත්‍රය තත්වාකාරයෙන් පවත්වාගෙන යාම අදාල බස් රථයේ කොන්දොස්තරවරයා විසින් කළ යුතු වේ.

11. මගීන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලබන සෑම ප්‍රවේශපත්‍ර යන්ත්‍රයක් සඳහාම වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් නිකුත් කරනු ලබන ප්‍රමිතිය පිළිබඳ අනුකූලතා සහතිකයක් ලබාගත යුතු ය.

12. (i) අධිකාරිය විසින් අනුමත කර සහතික කරනු නොලැබූ යන්ත්‍රයකින් ප්‍රවේශපත්‍ර නිකුත් නොකිරීමේ වරදට කොන්දොස්තරවරයකු වරදකරුවකු වන අතර

1. පළමු වතාවට රු. 250/ක
2. දෙවන වතාවට රු. 500/ක
3. තුන්වන වතාවට රු. 1000/ක

සේවා ගාස්තුවක් ගෙවීමට යටත් වන්නේ ය.

(ii) අධිකාරිය විසින් නියම කරනු ලබන විස්තර ඇතුළත් නොවන අපහැදිලි හෝ වෙනස් කරන ලද හෝ විකෘති කරන ලද ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරන කොන්දොස්තරවරයකු වරදකරුවකු වන

1. පළමු වතාවට රු. 250/ක
2. දෙවන වතාවට රු. 500/ක
3. තුන්වන වතාවට රු. 1000/ක

සේවා ගාස්තුවක් ගෙවීමට යටත් වන්නේ ය.

(iii) ප්‍රවේශපත්‍ර යන්ත්‍ර සහ එකී ප්‍රවේශපත් යන්ත්‍ර මගින් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් ඉහත (i) සහ (ii) උප වගන්තිවල දක්වා ඇති වැරදි හැරුණුවිට ප්‍රවේශපත්‍ර යන්ත්‍ර සහ එකී ප්‍රවේශපත්‍ර යන්ත්‍රවලින් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් සෙසු නියෝග කඩකරන කොන්දොස්තරවරයකු වරදකරුවකු වන අතර

1. පළමු වතාවට රු. 250/ක
2. දෙවන වතාවට රු. 500/ක
3. තුන්වන වතාවට රු. 1000/ක

සේවා ගාස්තුවක් ගෙවීමට යටත් වන්නේ ය.

(iv) අධිකාරිය විසින් ඉල්ලා සිටින අවස්ථාවක අදාල බස් රථයේ ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ යන්ත්‍රය මගින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර පිළිබඳ දෛනික මාසික සහ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම පැහැර හරින, නොසලකා හරින හෝ අපොහොසත් වන අවසර පත්‍රධාරියකු හෝ සාවද්‍ය විස්තර වාර්තා සපයන අවසර පත්‍රධාරියකු නියෝග කඩ කිරීම් සම්බන්ධයෙන් වරදකරුවකු වන අතර

1. පළමු වතාවට රු. 250/ක
2. දෙවන වතාවට රු. 500/ක
3. තුන්වන වතාවට රු. 1000/ක

සේවා ගාස්තුවක් ගෙවීමට යටත් වන්නේ ය.

13. (1) ප්‍රවේශපත්‍ර යන්ත්‍ර භාවිතා කිරීමේ සහ එකී යන්ත්‍ර මගින් ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් තුන්වන වතාවෙන් පසු නියෝග කඩකරන කොන්දොස්තරවරුන්ගේ කොන්දොස්තර බලපත්‍ර අවලංගු කළ හැකි වන අතර එකී අවලංගු වීම අධිකාරිය විසින් අදාල කොන්දොස්තරවරයාට දැනුම් දී දින 07ක් ඇතුලත අදාල කොන්දොස්තර බලපත්‍රය එම කොන්දොස්තරවරයා විසින් අධිකාරියට ආපසු භාරදිය යුතු වේ.

(ii) තුන්වන වතාවෙන් පසුව ප්‍රවේශ පත්‍ර යන්ත්‍ර භාවිතා කිරීමේ සහ එකී යන්ත්‍ර මගින් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් නියෝග උල්ලංඝනය කරන කොන්දොස්තරවරුන් සේවය කරන බස්රථ අසාදු ලේඛනගත කරනු ලැබිය යුතු අතර වාර දෙකකට වඩා අසාදු ලේඛනගත වීම මත අදාල බස්රථයේ මගී ප්‍රවාහන සේවා බලපත්‍රය අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට හේතු වේ.

(iii) අධිකාරියේ සභාපතිවරයාගෙන් උපදෙස් පැතීමකින් තොරව ප්‍රවේශපත්‍ර යන්ත්‍ර භාවිතා කිරීමේ සහ එකී යන්ත්‍ර මගින් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් අසාදු ලේඛනගත කර ඇති කිසිදු බස්රථයක් සඳහා ගමන්වාර ලබාදීම හෝ මාසික ධාවන සටහන් පත් නිකුත් කිරීම අධිකාරියේ වෙනත් කිසිදු නිලධාරියකු විසින් නොකල යුතු ය.

**වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය**

වයඹ පළාත් සභාවේ 1995 අංක 4 දරන වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 17 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන විෂය භාර වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් 1996.11.08 වැනි දින 1998.09.11 වැනි දින 2004.01.16 වැනි දින හා 2005.12.22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 04(අ) කොටසේ පළකරන ලද නියෝගය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බව නියෝග කරමි.

නීතිඥ අතුල විජේසිංහ,
ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය,
පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල, අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු, ඉඩම් ප්‍රවාහන, පරිසර, සංචාරක,
ආයෝජන සම්බන්ධීකරණ, සමූපකාර සංවර්ධන සහ ආහාර
සැපයුම් හා බෙදා හැරීම් පිළිබඳ පළාත් අමාත්‍ය,
වයඹ පළාත.

සංශෝධන

03:02(ඊ) පවත්නා 03:02(ඊ) හි (i) හා (ii) වගන්ති ඉවත්කර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.

"වයඹ පළාත තුළ හෝ පළාත් අතර අමතර ගමන්වාර ලබා ගන්නා බස්රථයක් සඳහා මාසිකව රු. 1000/-ක මුදලක් ගෙවා අමතර ගමන්වාර බලපත්‍රයක් ලබා ගත යුතු වේ.

11:03 පවත්නා 11:03 හි සඳහන් ගාස්තුව රු. 1000ක් වශයෙන් සංශෝධනය කිරීම.

11:04 පවත්නා 11:04(උ) උප වගන්තියට පසුව 11:04(ඌ) උප වගන්තියෙන් "අමතර ගමන්වාර අවසර පත්‍රයක් නොමැතිව ධාවනයේ යෙදීම වෙනුවෙන් රු. 1500/- " යනුවෙන් එකතු කිරීම ද, පවත්නා 11:04 (ඌ) උප වගන්තිය 11:04(එ) යනුවෙන් නැවත අංක යෙදීමෙන්ද සංශෝධනය කරනු ලැබේ.

11:05 පවත්නා 11:05 හි සඳහන් ගාස්තුව රු. 1000/- ක් වශයෙන් සංශෝධනය කිරීම.

15:01(අ) පවත්නා 15:01(අ) සිට (ඈ) දක්වා සියළු වගන්ති ඉවත්කර 15:01(අ) ලෙස පහත වගන්තිය එකතුකරනු ලැබේ.

"වයඹ පළාත තුළ කර්මාන්තශාලා මගී ප්‍රවාහනයේ යෙදෙනු ලබන සියළු පෞද්ගලික බස්රථ රු. 5000/- ක වාර්ෂික ගාස්තුවක් වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට ගෙවා අවසර ලබාගත යුතුය."

15:01(අ) පවත්නා 15:01 හි (ඉ) වගන්තිය 15:01(ආ) ලෙස සංශෝධනය කරනු ලැබේ.

16(අ) පවත්නා 16(අ) හි ගාස්තු පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| | *වාහන පන්තිය* | *ගාස්තුව*<br>*රු. ශත.* |
|---|---|---|
| 1. | යතුරු පැදි A,A1 | 1,000.00 |
| 2. | ත්‍රිරෝද රථ B1 | 1,500.00 |
| 3. | සැහැල්ලු වාහන B | 8,500.00 |
| 4. | පුහුණුව රහිත සැහැල්ලු B | 4,000.00 |
| 5. | බර වාහන D | 10,000.00 |
| 6. | බර වාහන පුහුණුව රහිත D | 5,000.00 |
| 7. | පෙර පුහුණු පරීක්ෂාව | 500.00 |
| 8. | සංස්කරණ පුහුණු (පැයකට) | 1,000.00 |

16(ඊ) පවත්නා 16(උ) ජේදයෙහි සඳහන් බලපත්‍රය ලබාදීමේදී බලපත්‍ර ගාස්තුවට අමතරව අය කරනු ලබන සේවා ගාස්තු පහත සඳහන් අයුරින් සංශෝධනය කරනු ලැබේ.

| | | රු. ශත. |
|---|---|---|
| 01. | A මාර්ගයක් සඳහා | 100,000.00 |
| 02. | B මාර්ගයක් සඳහා | 75,000.00 |
| 03. | C මාර්ගයක් සඳහා | 50,000.00 |
| 04. | D හා E මාර්ගයක් | 25,000.00 |
| 05. | සුඛෝපභෝගී බස්රථ සඳහා | 100,000.00 |

පවත්නා 16(උ) වගන්තියට පසු පහත සඳහන් වගන්ති එකතු කරනු ලැබේ.

16(එ) වයඹ පළාතෙන් බස්රථ නිදහස් කිරීමේ සහතික ලබාදීම සඳහා එක් සහතිකයක් සඳහා රු. 1,000.00වූ සේවා ගාස්තුවක් අයකරනු ලැබේ.

16(ඒ) නව බලපත්‍ර නිකුත් කිරීමේදී බලපවත්වන කොන්දේසි ආරක්ෂා කිරීම පිණිස රු. 10,000.00ක ආපසු ගෙවන ඇප තැන්පතු මුදලක් අයකරනු ලැබේ. යම් හෙයකින් කිසියම් බලපත්‍ර ලාභියෙකු බලපත්‍ර කොන්දේසි කඩකල හොත් ඔහුගේ ඇප තැන්පතුව ආපසු නොගෙවා අහෝසි කර ආදායම් ගිණුමට මාරු කරනු ලැබේ.

16(ඔ) මාසික ධාවන සටහන් පත්‍ර/පිවිසුම්පත්‍ර නියමිත දින ලබා නොගන්නා අවස්ථාවල එම ප්‍රමාද කාලය මාසයක කාලයක් ඉක්මවා ඇත්නම් මසකට හෝ කොටසකට රු. 100.00 බැගින් වූ අතිරේක සේවා ගාස්තුවක් අය කරනු ලැබේ.

11 - 32/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.